

## ප්‍රංශයේ දරුවන් පුබුදුකරන පුබුදු

**පැ**රිස් නුවර ශ්‍රීලංකා ධම්මචක්ක විහාරස්ථානයේ ඉරුදින දහම් පාසැලේ දරුවන්ගේ සිංහළ භාෂා දැනුම, රචනා කුසලතාව මෙන්ම ආගමික පසුබිම වර්ධනය කරලන අතරම සිංහලකම පුබුදුවාලීමේ අරමුණින් මෙම පෙබරවාරි මස ධම්මචක්ක ළමා සමාජය ආරම්භ කරන ලදී. එහි කුළුඳුල් කාර්‍යය වූ පුබුදු මාසික ළමා සහරාව පළකිරීමෙන් පසු එහි මංගල කලාපය පසුගිය දා ධම්මචක්ක දහම්පාසැලේ අනුශාසක මෙන්ම විහාරාධිපතිද වන ශාස්ත්‍රාචාර්‍ය පූජ්‍ය කෝ. ආනන්ද ස්වාමීන් වහන්සේට එම ළමා සහරාවේ සංස්කාරක මණ්ඩලයේ දයාන් කිරිදිආරච්චි දරුවා විසින් පිළිගන්වන ලද අවස්ථාව කැමරාවට හසුවූ අයුරු මෙසේය.

♦ **අමර ගුණසේකර** Paris France



## සුසී මව් පදවිය ලබා

**ශ්‍රී ලංකාව බිහි කළ විශිෂ්ඨතම කෙටි ධාවන ශූරිය වන ඔලිම්පික් රිදී පදක්කම්ලාභිනී සුසන්තිකා ජයසිංහ ගිය 31 වෙනි දින නාරාහේන්පිට පුද්ගලික රෝහලකදී පුත්‍රුවනක් බිහිකරමින් මව් පදවියේ කිරුළ පැළඳුවාය. මාතෘත්වයේ උත්තරීතර ගෞරවය ලබාගත් සුසන්තිකා නම් අප රටට කීර්තියක් ගෙනා ධාවන රැජිණ තමා මෙලොවට බිහි කළ එම කිරිකැටියා සමග සිය ආදරණීය සැමියා හා එක්ව රෝහලේදී ප්‍රීතිමත් සිතින් පසුවනු කැමරා කාචයක සටහන් වූයේ මෙසේය.**

Susanthika Jayasinghe the best short distant runner Sri Lanka so far produced, and the Olympic silver medalist, gave birth to a son at a private nursing home in Narahenpita, Colombo, on 31st March. Here she is sharing a moment of joy of being mother with her husband at her bedside.

# අපේ දේ අගය කළ ඩිල්මන්

**ඩි**ල්මන් ජයරත්න අංශ කිහිපය කින්ම ශ්‍රීලංකා චිත්‍රපට කර්මාන්තයට සම්බන්ධ වූ කලාකරුවෙකි. ඔහු කැමරා ශිල්පියෙකි. සංස්කාරක වරයෙකි. චිත්‍රාගාර හිමියෙකි. චිත්‍රපට නිශ්පාදකවරයෙකි. එසේම ඕර්වෝ සිනමා සහ ඡායාරූප පටල ශ්‍රීලංකාවට හඳුන්වා දුන් පුද්ගලයාද වන්නේ ඔහුය.

ඩිල්මන් ශාස්ත්‍ර හදෑරුයේ කෑගලු මහා විද්‍යාලයෙනි. කෑගල්ලේ ප්‍රධාන පෙළේ ඡායා රූප ශාලාවක් වූ ජයරත්න ඡායාරූප ශාලාවෙහි හිමිකරු වූයේ ඩිල්මන්ගේ පියාය. ඒ නිසා පාසැල් සමයේදීම ඔහු ඡායාරූප ශිල්පය උගත්තේය.

සිය බාප්පාට මි. මී. 16 කැමරාවක් තිබුණු බැවින් කුඩා අවධියේදීම සිනමාවට එකතුවීමේ වාසනාවද ඩිල්මන්ට හිමිවිය. වයස අවුරුදු 11 දී ඔහු කෙටි චිත්‍රපටයක් තැනූ අතර, වයස 18 වන විට ඩිල්මන් ඕස්ට්‍රේලියානු රූපවාහිනියේ ලංකා වාර්තාකරු වූයේය. එම අවධියේ වාර්තා චිත්‍රපට කිහිපයක් තැනූ ඔහු ඒවායේ කැමරා ශිල්පියාද විය.

1966 දී කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයෝ පිරිසක් එක්ව වෙර නමින් කෙටි චිත්‍රපටයක් තැනූහ. එහි කැමරා ශිල්පියා වූයේ ඩිල්මන්ය

1969 දෙසැම්බර් 18 වන දා තිරගත කරනලද පියසිරි ගුණරත්න නිර්මාණය කළ මොකද වුණේ චිත්‍රපටයේ කැමරා ශිල්පියා වූයේ ද ඩිල්මන්ය.

ලෝකයේ ප්‍රථම වරට පාසැල් ශිෂ්‍යයින් පිරිසක් එක්ව මහජන ප්‍රදර්ශණය සඳහා වෘතාන්ත චිත්‍රපටයක් තැනුවේ නම් ඒ නිම්වළලයි. එහි කැමරාකරණය ඩිල්මන්ගේ විය.

1980 වර්ෂයේ සිංහළ සිනමාව වර්ණ චිත්‍රපට ක්‍රමයට පිවිසෙද්දී රසායනාගාර කටයුතු කෙරුණේ ඉන්දියාවේ හෝ එංගලන්ත යේය. අඩු මුදලකට, අඩු දින ගණනකින් චිත්‍රපට රසායනාගාර කටයුතු කරගැන්මට ලාංකික සිනමා කලාකරුවන්ට හොංකොං කලර් මූවි ලැබ් ශ්‍රීලංකාවට හඳුන්වා දුන්නේ ද ඩිල්මන් ජයරත්නය.



එහි ප්‍රථමයෙන්ම රසායනාගාර කටයුතු කළ චිත්‍රපටය වූයේ රණදෙරණයි. ලෝරන්ස් කුරේ සමග එහි සම අධ්‍යක්ෂක වශයෙන් ඩිල්මන් කටයුතු කළ අතර එම චිත්‍රපටය 1984 ජූලි 21වෙනි දින තිරගත කරණ ලදී.

ශ්‍රීලංකාවට ඕවෝ වර්ණය හඳුන්වා දුන්නේද ඩිල්මන් ජයරත්නය. ඕවෝ වර්ණයෙන් තැනූ ප්‍රථම චිත්‍රපටය වූයේ එච්. ඩී. ප්‍රේමරත්නගේ දෙවන ගමනය. ඉන්පසු වර්ණයෙන් තැනූ සිංහළ චිත්‍රපට විසිපහකට අධික සංඛ්‍යාවකට ඩිල්මන් ඕවෝ වර්ණ රසායනාගාර කටයුතු කරදුන්නේය.

චිත්‍රපට කාර්මික ශිල්පීන් හෝ නළුනිළියන් චිත්‍රපට කටයුතු කරද්දී ඊට උපරිම පහසුකම් ලබාදීමට ඩිල්මන් කටයුතු කළ බව සිනමාවට සම්බන්ධ අය හොඳින් දනිති.

කප්රුකක් යයි සිතා ඩිල් ප්‍රොසෙස් රසායනාගාරය ගොඩනැගූ මුත් එහි තනන්නේ රා යයි වරක් කී ඩිල්මන්, පොල් ගසෙන් පැනි තනන්නට උවමනා වුවත් තනන්නේ රා බැවින් හොඳ චිත්‍රපටයක් තැනීමේ ආ ආශාවෙන් අවරගිර නිශ්පාදනය කළ බව පැවසීය.

හරවත් දෙයක් කළ බැවින් අවරගිර විදේශීය චිත්‍රපට උළෙලවල් කීපයක්ම නියෝජනය කලායයි සතුටු වූ ඩිල්මන් තවත් උසස් චිත්‍රපටයක් නිශ්පාදනය කිරීමේ ආශාවෙන් සිටියේය. ඔහු මිය යෑම සැබැවින්ම අපේ සිනමා කර්මාන්තයට සිදුවූ බලවත් පාඩුවකි.

♦ **හෙන්රි ප්‍රියශාන්ත මෙන්ඩිස්**

## ආදර්ශයට ගතයුතු සිංහළ තරුණ යුවලක්

**මෙ**හි දකුණු පස පළවන මංගල පින්තූරයේ සිටින තරුණ යුවල වන දුලාංජලී සහ තිළිණ යන දෙදෙනාම වයස අවුරුදු තුනේදී පමණ ශ්‍රීලංකාවෙන් බැහැරට ගිය දරුවෝ වෙති. එහෙත් ඔවුන් සිංහළ බස සිංහළ සිරිත් විරිත් හැදියාව අගයන අය බවත් ඇසුවෙමි. ඒ දෙදෙනගේ විවාහය සිදුවුයේද සිංහළ සිරිතට අනුව ලංකාවේ ඒ අයගේ මුල් ගමේය. මංගල්‍යයට කලින් දා කිරි අම්මලාට ඔවුන්ගේ අතින් දානයක් ද පිරිනමා ඇත.

දුලාංජලී ලංකාවිත්ති පත්‍රයට නවසීලන්තයේ සිට කවි ලියන ශ්‍රීයා කුමාරසිංහ මහත්මියගේ දියණියයි.

## ✻ වේවා සිරි සුබ මංගලම් ! ✻



## Dulanjalie - Thilina
## දුලාංජලී - තිළිණ

**නවසීලන්තයේ වෙලිංටන් නුවර වෙසෙන දුලාංජලී කුමාරසිංහ සහ තිළිණ තන්තිරිගම තරුණ යුවළගේ විවාහ මංගලෝත්සවය මේ නොබෝදා දෙමාපිය, ඥාති හිතෛෂීන් රාශියකගේ සහභාගිත්වයෙන් හා ආශිර්වාදයෙන් යුක්තව ශ්‍රීලංකාවේ දී ඉතා උත්කෂ්ටවත් අන්දමින් සිදුවිය.**

**21 වියැති දුලාංජලී, නවසීලන්තයේ ඔටේගෝ සරසවියේ උපාධිධාරිණියක් වන අතර ඇය වෙලිංටන්හි රසායනාගාර විද්‍යාඥවරියක ලෙස සේවය කරයි.**

**25 වියැති තිළිණ, නවසීලන්තයේ මැසේ සරසවියේ පරිගණක විද්‍යා උපාධිධාරියෙකි. ඔහු දැන් පරිගණක උපදේශකවරයෙකු ලෙස නවසීලන්තයේ ජාත්‍යන්තර සමාගමක සේවය කරයි.**

The wedding of this young couple, Dulanjali and Thilina took place recently in Sri Lanka amidst the blessings of their parents, relations and friends.

The bride - Dulanjalie Kumarasinghe (21 year old, graduate of Medical laboratory Science, University of Otago, works as a lab scientist in Wellington)

The bridegroom - Thilina Thanthirigama (25 years old, graduate of computer science, Massey University,works as a computer consultant at OPUS International, Wellington.

Bride's parents - Sriya Kumarasinghe is a lecturer at the University of Otago in Dunedin. Upali Kumarasinghe is a businessman in Japan.

Bridegroom's parents - Dr. Gunathilaka Thanthirigama, works at LandTransport NZ, Dr. Mangalika Thanthirigama, works at Statistics NZ. Both live and work in Wellington.

We wish the young couple the blessings of the Triple Gem and happiness to the brim in years ahead ! **( Lanka Viththi)**

